සියලුම හිමිකම් ඇවිරිණි.
*All Rights Reserved*



# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

**12 ශ්‍රේණිය** **නර්තනය** **පිළිතුරු පත්‍රය**

## I කොටස

01. ( 3 ) 02. ( 1 ) 03. ( 2 ) 04. ( 2 ) 05. ( 4 ) 06. ( 1 ) 07. ( 4 ) 08. ( 4 ) 09. ( 1 ) 10. ( 2 )
11. ( 4 ) 12. ( 3 ) 13. ( 2 ) 14. ( 3 ) 15. ( 3 ) 16. ( 1 ) 17. ( 2 ) 18. ( 4 ) 19. ( 1 ) 20. ( 1 )
21. ( 1 ) 22. ( 2 ) 23. ( 1 ) 24. ( 2 ) 25. ( 1 )

26. පුද්ගල අවකාශය / පොදු අවකාශය
27. සැස්සෝරුව හා කොරවක් ගල
28. පහන් මඩුව හා දෙවොල් මඩුව
29. ලඝු /ගුරු
30. ග්‍රහ පන්ති /හිංහතරේ / බලි මඩුපුරය.
31. මිනික්කු, පච්චා, කත්ති, තාඩි.
32. භරත / කථක්
33. දිසාලා / ජීවහත්ත.
34. සොකරි / කෝළම්
35. පහන් මඩුව / කුමාර සමයම
36. පත්තිනිහාමි
37. භරත
38. උරිද්දියාගය / රටයකුම
39. මලය
40. මහා පරාක්‍රමබාහු
41. සොකරි.
42. රාහු අසුරේන්ද්‍රයා
43. දේවදාසීන්
44. පණීභාරත මහතා
45. පහතරට
46. අමරදේව / ලයනල් අල්ගම.
47. බලි
48. අභිනය දර්පනය
49. කොහොඹා කංකාරිය
50. රතිය

## II කොටස

01. (i)

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| ∧ | | ∧ | | / | | |
| 1 | 2 | 1 | 2 | 1 | 2 | 3 |
| තෙහිං | තකු | තෙහිං | තකු | තෙහිං | ජිං | |
| ග | ත් | ත | ත් | ජිං | තරි | කිට |

(ii)

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ∧ | | | / | | | | ∧ | | | / | | | |
| 1 | 2 | 3 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 1 | 2 | 3 | 4 |
| ය | නෙ | න | ක | ලු | ග | ඟ | එ | තෙ | ර | වැ | ඩ | සි | ට |
| රු | පු | න් | ය | න | ම | ං | බ | ල | ව | බ | ල | වා | |
| දි | ලෙ | න | ර | න් | ක | ඟ | අ | ත | ට | අ | ර | ගෙ | න |
| වි | දු | ලි | ය | ක් | මෙ | න් | ලෙ | ල | ව | ලෙ | ල | වා | |

(iii)

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ∧ | | / | | | ∧ | | / | | |
| | 1 | 2 | 1 | 2 | 3 | 1 | 2 | 1 | 2 | 3 |
| පදය | දො | ං | ජී | ං | ත | ග | ත | දො | ං | ත |
| අඩව්ව | ත | ත් | ත | ක | ට | ත | ක | රො | ං | |
| | තත් | කඩ | තත් | කඩ | කුඳ | ත | ක | රො | ං | |
| | ත | ක | රො | ං | ග | ජී | ං | ජී | කු | ද |
| | කි | ටි | ත | ක | ට | කු | න් | ද | ත් | |
| | ජී | ක | රො | ං | | | | | | |

02. (i) කොහොඹා කංකාරිය, කඩවර කංකාරිය, වලියක් මංගල්‍ය.

(ii) අස්නෙ / ආවැන්දුම / යක් ඇනුම / හත්පද පෙලපාලිය / කොහොඹා හැල්ල / යකුන් පදය.
ඉහත දක්වා ඇති නර්තන අංගයන් දෙකක් විස්තර කර තිබිය යුතුය.

(iii) ශාන්තිකර්මයක් පැවැත්වීමේදී සාමාජීය වශයෙන් සශ්‍රීකත්වය, භව භෝග සම්පත් වර්ධනය, ලෙඩ රෝග, අපල උපද්‍රව දුරු වීම ආදී අරමුණු මුදුන් පමුණුවන අතර උඩරට කොහොඹාකංකාරිය දේවාශිර්වාදය ලබාගැනීම අරමුණු කරගනිමින් බුදුන් වන්දනාමාන කොට කොහොඹා දෙවිවරු / බණ්ඩාර දෙවිවරු / මෙලෙයි, රුප්පා, වැදි යකුන් මෙන්ම වීරමුණ්ඩ, දූඩිමුණ්ඩ ආදී දෙවිවරුන් පුද ලබයි. (විස්තර කර තිබිය යුතුයි.)

03. (i)
* දේශීය නර්තන සම්ප්‍රදායන් ප්‍රදේශ අනුව වෙනස්වන ආකාරය,
* අංගහාර, නර්තන අංග, වාද්‍ය භාණ්ඩ, රංග වස්ත්‍රාභරණ එකිනෙකට වෙනස් වන ආකාරය.
* ශාන්තිකර්ම වල විවිධතාවයන්.
* පුරාවෘත්ත.
* ගායන, වාදන ආදිය පිළිබඳව උදාහරණ දක්වා පිළිතුර සැපයිය යුතුය.

(ii) **වෙස් ඇඳුම් කට්ටලය.**
හිස වෙස් පායින්පත, ශිඛාබන්දනය, නෙතතිමාලය, ජටාව, ජටාපටිය, අවුල් හැරය, උල් උඩය, හගල, බුබුලු පටිය, තෙමෙත්ත, උරබාහු, බඳ පටිය, පච්චවාඩම, පොත්පොට, බන්දි වලලු, තරු, තෝඩු පත්, සිලම්බු ආදී වෙස් ඇඳුම් කට්ටලයේ ආයිත්තම් සඳහන්කර ඒවා පළඳින්නේ කොතැනටද, සුවිශේෂීතාවයන් හා ආභරණ කට්ටලය සකසා ඇති අමුද්‍රව්‍ය රිදී, සුදු යකඩ ආදිය මෙන්ම පිත්තල යන්න සඳහන්කර තිබිය යුතුය.

04. (i) මහාවංශය / සමන්තපාසාදිකාව

(ii) දුටුගැමුණු / භාතිකාභය / පණ්ඩුකාභය රජු.
දේවානම්පියතිස්ස රජ සමය
ඉහත රජවරුන්ගේ කාලවල ලැබුණු අනුග්‍රහ උදාහරණ සහිතව සඳහන්කර තිබිය යුතුය.

(iii)
* පොළොන්නරු යුගයේ 1 වන පරාක්‍රමබාහු රජුගෙන් මෙන්ම
* නිශ්ශංකමල්ල රජුගෙන් ලැබුණු අනුග්‍රහ (භාරතීය සම්භවය)
* සරස්වතී මණ්ඩපය
* රූපාවතී බිසව නලඟනක් වීම.
* ශිව දේවාලයෙන් හමුවූ නටරාජා පිළිරුව, දැදිගම කොටවෙහෙරේ නළඟන පිළිරුව, වටදාගේ රූකම්, (භාරතීය නර්තනයට සමාන හැඩතල) ඉහත කරුණු විස්තර කළ යුතුය.

05. (i)
- ගැමි නැටුම් යනු ගැමි ජනයාගේ සරල ජීවිතය තුළ ඔවුන් විසින් නිර්මාණය කරගත් කලාංගයක් වීම.
- සරල නාද රටා, ගායනා, දෛනික කටයුතු, අදහන දෙවිවරු හා ස්වාභාවික වස්තූන්ට ගෞරව පුදකරමින් කවි සෑදීම.
- කවි ගායනා වලින් උදාහරණද දක්වා
- ගැමි නැටුම් වලට උදාහරණද ඉදිරිපත්කර පිළිතුරු සැපයිය යුතුය.
- සරල වස්ත්‍රාභරණ (එදිනෙදා අඳින) වේෂනිරූපණයද සරල වීම.
- සාමූහික බව.

(ii) කෝලම් නාටක වල හමුවන ජස ලෙන්චිනා, මුදලි, නොංචි, අණබෙර, පොලිස්, හේවා ආදී කෝලම් වල චරිත ඉදිරිපත් කරන ආකාරය වෙස් මුහුණු හා රංග වස්ත්‍රාභරණ සකසා ඇති අයුරු සංවාද දෙබස් ගායනා මගින් චරිත නිරූපණය තීව්‍ර කරන ආකාරය විස්තරාත්මකව ඉදිරිපත් කළ යුතුය.

06. (i) චින්නයියා / පොන්නයියා.
වාඩිවේලු / ශිවනාදන්.
වර්තමාන භාරත නාට්‍යම් සම්ප්‍රදාය ක්‍රමානුකූල ලෙස සකස් කිරීමට හැකි විය. 1789 1824 කාලය තුළ ජීවත් වූහ. වේදිකාවට උචිත අයුරින් භරත නාට්‍යම් සංදර්ශනය සැකසීය.
ආලාරිප්පු / ජතිශ්වරම් / ශබ්දම් / වර්ණම් / පදම් / තිල්ලානා / ශ්ලෝකම්

(ii) **ශබ්දම් - 3 වන අංගය**
ස්තෝත්‍ර ගායනයට අනුව කරන නැටුමකි. සරල වශයෙන් අභිනය ප්‍රකාශනය කිරීම සිදුකෙරේ. ගායනයත් සමග නර්තනය බහුලව යෙදෙන ප්‍රථම අවස්ථාවය.
**පදම්**
නැටුම් සංදර්ශනයේ දෙවන භාගය ආරම්භ වන්නේ පදම් වලිනි. ජාවලී, කීර්තනම්, ක්ෂේත්‍රඥ ආදී වශයෙන් පදම් ගණනාවකි. සාත්වික අභිනය හා මුද්‍රා භාවිතය සිදුකරයි.

(iii) නටුවනාර් යනු භරත නාට්‍යම් හි සංගීතය මෙහෙයවන්නා මෙන්ම නටුවාංගම් යන තාලය තබන තාලම්පට වැනි වාද්‍ය භාණ්ඩ ඔහු වාදනය කරයි.
මෘදංගය ප්‍රධාන තාල වාද්‍ය භාණ්ඩයකි. කර්ණාටක සංගීතයට අදාළව මෘදංගය වැයේ. (විස්තර කරන්න.)

07 (i)

- 1919 රත්නපුර එපිටවෙල උපතලද බව.
- වැඩිදුර අධ්‍යාපනය සඳහා භාරතයට ශිෂ්‍යත්වයක් ලැබීම Language of Kathakali කෘතිය පළකිරීම.
- සුභාශ් චන්ද්‍රබොස්ගේ චරිත කතාව සිංහලයට පරිවර්තනය කිරීම.
- කොළඹ විශ්ව විද්‍යාල කොලීජියේ ඉන්දියානු නැටුම් ඉගැන්වීම.
- නැෂනල් තියටර් කලායතනය පවත්වාගෙන යාම.
- 1950 තම්බපණ්නි නමින් ආයතනයක් ආරම්භ කිරීම.
- 1950 සැළලිහිණිය ඉගිනළුව නිෂ්පාදනය කිරීම.
- තිත්ත බත, දියසේන, සකුන්තලා, සාරභූමි, පරෙවිය දිය ඔහුගේ නිර්මාණය.
- හංස වන්නම නිර්මාණය කිරීම.

(ii) චිත්‍රසේන ශූරීන්ගේ කරදිය දේශීය මුද්‍රා නාට්‍ය ක්ෂේත්‍රයේ සුවිශේෂීතම මුද්‍රා නාට්‍යය බව.
සිසී නම් තරුණිය වටා ගෙතුනු කතාව (වෙරළබඩ මුහුදු යමින් ජීවිකාව ගෙන යන මිනිසුන්ගේ වේදනාව අපූරුවට කතාවට යොදා ගැනීම. වේදිකාව පරිහරණය හා රංග වස්ත්‍රාභරණ වල විශේෂත්වය සංගීතය මගින් ලැබුණු අත්වැල ....... (ජීවිතයත් මුහුද වගේ ගීතය)
ආලෝකය හා තාක්ෂණික ශිල්ප මගින් මුහුද, මකුළු දැල, කුණාටුව යන අවස්ථා නිරූපණය.

08. (i) නර්තන කලාවට අතීතයේ නොතිබුණු කාන්තා දායකත්වය කොළඹ යුගයේදී ලැබීම.
වාණිජ භාණ්ඩයක් ලෙස ප්‍රසාංගික වේදිකාවේ නර්තනයන් අලෙවි වීම. නර්තනයට අවස්ථා ඇති වීම.

(ii) පාසල් වල / විශ්ව විද්‍යාල වල විෂයයක් වශයෙන් දියුණු වූ ආකාරය පහදන්න.

(iii) සංස්කෘතික හුවමාරුවේදී අන්තර් ජාතික වශයෙන් දේශීය නර්තන ව්‍යාප්ත වීම හා පෙර, අපරදිග නර්තන වල ආභාසය ලැබීම හා එම නර්තන ව්‍යාප්ත වීම. (ඉහත කරුණු විස්තර කර තිබිය යුතුය)

09. (i) නර්තනය හා සංගීතය එකට බැඳී ඇති බව.
දේශීය / භාරතීය හා අපරදිග නර්තන වලට සංගීතය යෙදෙන ආකාරය උදාහරණ සහිතව විස්තර විය යුතුය.
උදා උඩරට නැටුම් ගැට බෙරයේ පාදයට කවි ගායනා සහිතව.
භරත නැටුම් කර්ණාටක සංගීතයට අනුව.

(ii) රූපවාහිනියේ සම්ප්‍රදායික නර්තන ඉදිරිපත් වන අයුරු විවේචනාත්මකව විමසිය යුතුය.
වේ වන විට සංස්කෘතික අනන්‍යතාවය සහිත නර්තන තිබේද / නැද්ද, ඒවා රැක ගැනීමට ක්‍රියාමාර්ග මොනවාද යන කරුණු ඇතුලත් විය යුතුය.